# යෞවන භික්ෂු ආකල්ප පිළිබඳ විමසීමක්: ධම්මපදපාළියේ චිත්තවග්ගයේ කථා ප්‍රවෘත්ති හතක් ඇසුරින් කෙරෙන සිද්ධි අධ්‍යයනයකි

මහකුඹුක්වැවේ නන්දාලෝක හිමි[1]

## හැඳින්වීම

භික්ෂු ජීවිතය ඒ සඳහා ම නිර්දේශ වූ ධර්ම-විනය ප්‍රතිපත්ති සමූහයක් මත සකස් වූවකි. බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදාළ එකී මූලික ධර්ම-විනය ප්‍රතිපත්තිවල පිහිටා කාලීන සමාජ, ආර්ථික හා පාරිසරික වෙනස්වීම්වලට අනුව කටයුතු කළහැකි ද යන්න ගැඹුරින් විමසිය යුතු කාරණයකි. කෙසේ වෙතත් වසර 2600 ක පමණ ශාසන ඉතිහාසය තුළ යථෝක්ත ධර්ම-විනය ප්‍රතිපත්තිවලට පටහැනි නොවන පරිදි භික්ෂු ජීවිතය යම් යම් වෙනස්වීම්වලට භාජනය වූ බව ද ප්‍රකටය. කෙබඳු වෙනසක දී වුවත් භික්ෂු ජීවිතය එහි මූලිකම ලක්‍ෂණය වන බ්‍රහ්මචාරී ජීවිතයට හා පරාර්ථ චර්යාවට අවිරුද්ධව පවත්වා ගැනීම වැදගත් කාරණයකි. මෙම සම්මන්ත්‍රණ පත්‍රිකාවෙන් සාකච්ඡා කෙරෙන්නේ යෞවන භික්ෂු ආකල්පවල ස්වභාවයත් ශාසනික අරමුණට අනුව භික්ෂු ජීවිතය මෙහෙයවා ගැනීම සඳහා එම ආකල්ප කවරාකාරයෙන් සකස්කර ගතයුතු ද යන්නත් ධම්මපදපාළියේ චිත්තවග්ගයෙන් තෝරාගත් කතා පුවත් හතක් ඇසුරින් විමසා බැලීමයි.

## පර්යේෂණ ක්‍රමවේදය

ධම්මපදපාළියේ චිත්ත වග්ගයේ ගාථා 09 ක් සඳහා ඉදිරිපත්ව ඇති කතා පුවත් 07 ක් සිද්ධි අධ්‍යයනයක් වශයෙන් තෝරාගත් අතර ඒ අනුව එම කතා විශ්ලේෂණය කිරීමෙන් යෞවන භික්ෂු ආකල්ප පිළිබඳ මෙහි දී විමසීමට ලක් කරනු ලැබේ. වර්තමාන ලාංකේය සමාජයේ යෞවන භික්ෂු ක්‍රියාකාරකම් දැඩි විවේචනයට ලක්වන විවිධ හේතු හා ඒ සඳහා බලපා ඇති සමාජාර්ථික පසුබිම ද මෙහි දී විමර්ශනයට බඳුන් කෙරේ. එමෙන් ම භික්ෂු සමාජයේ ස්ථාවර භාවය සඳහා භික්ෂු ආකල්ප සකස් විය යුතු ආකාරයත්, නූතන සමාජ ආකල්පවලට හා ජීවන රටාවට අනුගතව ඒවා පවත්වා ගැනීමත් පිළිබඳව අවබෝධය ලබාදීම මෙමගින් සිදුකෙරේ.

## සාකච්ඡාව

බුදුරජාණන් වහන්සේ විසින් විමුක්තිය සාක්‍ෂාත් කරගත් ප්‍රථම භික්ෂු කණ්ඩායම අමතා වදාළේ "සියලු ලෝකවාසීන්ගේ හිතසුව පිණිස ධර්මදූත

---

[1] 2009nandaloka@gmail.com

මෙහෙවරෙහි යෙදෙන ලෙසයි". එයින් පැහැදිලි වන්නේ භික්ෂුව ස්වකීය ජීවිත අරමුණ පෞද්ගලික වශයෙන් සඵලකරගත් පසුව තම ජීවිතය අන් අයගේ යහපත පිණිස යෙදවීම විශාල වගකීමක් වශයෙන් සලකන බවයි. මෙවැනි ප්‍රතිපදාවක් සඳහා බලපාන ආකල්ප සමූහයක් භික්ෂුව තුළ ගොඩනගාගෙන තිබීම අත්‍යාවශ්‍ය කාරණයක් වන අතර ඒ සඳහා ක්‍රමානුකූල වූත්, නිවැරැදි වූත් මඟ පෙන්වීම ධර්ම-විනය ප්‍රතිපත්ති මගින් මැනවින් පැහැදිලිකර ඇත. භික්ෂුවකට සාමාජීය ජීවිතයක් ගතකරමින් සාම්ප්‍රදායික ජීවන රටාවක් තුළ දෛනිකව කටයුතු කරන විට මුහුණ දීමට සිදුවන තත්ත්වයන් ඉතා සංකීර්ණය. එබැවින් සමාජ හා පුද්ගල වෙනස්වීම් හඳුනාගෙන එම බලපෑම්වලට අනුගත වීමෙන් බ්‍රහ්මචාරී ජීවිතයට පටහැනි නොවන පරිදි ක්‍රියා කිරීමේ හැකියාවක් භික්ෂුවට තිබිය යුතුය. එම හැකියාව නිවැරැදි ආකාරයෙන් භාවිත නොකිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් නූතන යෞවන භික්ෂූන්ගේ ජීවිතය දැඩි විවේචනයට භාජනය වෙමින් තිබෙන බව නිතර අසන්නට ලැබෙන ප්‍රවෘත්තියකි. එබැවින් මෙම සිද්ධි අධ්‍යයනය සඳහා තෝරාගත් මේඝිය, භාගිනෙය්‍ය සංඝරක්ඛිත, උකටලී වහන්දෑ හා චිත්තහත්ථ වැනි භික්ෂූන් වහන්සේලාගේ ජීවිත සම්බන්ධ එම කතා පුවත් පුළුල් විමසීමකට ලක්කර ඒවායින් හෙළිවන දුර්වලතා පෙන්වා දීමෙන් තරුණ නූතන භික්ෂු ආකල්ප ප්‍රතිසංවිධානය කරනු ලැබේ.

භික්ෂු ජීවිතයේ අභිවෘද්ධිය පිණිස ආචාර්ය-උපාධ්‍යාය හා සද්ධිවිහාරික සම්බන්ධතාව සර්වකාලීනව ඉතා වැදගත් සාධකයකි. ශිෂ්‍යයා සද්ධිවිහාරික නමින් හැඳින්වීමෙන් ම ප්‍රකට වන්නේ ඔහු කෙනෙකුගේ උපදෙස් අනුව ක්‍රියා කරන්නකු බවයි. එසේ ම ඔහු අන් අයකු සමග එක්ව ජීවත්වන්නට සූදානම් වන තැනැත්තකු ද වෙයි. අන් කෙනෙකු සමග ජීවත්වනවා යනු කෙනෙකුගේ අදහස් හා අවශ්‍යතා හඳුනාගෙන ඒවාට අනුගතව හා එම අවශ්‍යතා ඉටුකරමින් ජීවත්වීමට හුරුවීමයි. ඒ අනුව සද්ධිවිහාරික භික්ෂුවකට උපාධ්‍යායයන් වහන්සේ හා ආචාර්යවරයා සමග ජීවත්වීමේ හැකියාව තිබිය යුතුය. මේඝිය කතාවෙන් ප්‍රකට වන්නේ ගුරු අවවාදය ඉක්මවා කටයුතු කිරීමට ගත් උත්සාහයක් පිළිබඳවයි. එය තාරුණ්‍යය සමග කෙනෙකු තුළ ඇතිවිය හැකි තත්ත්වයක් වුවද, එක්තරා ආකාරයකින් දිවිගෙවීමේ දී එය දුර්වලතාවක් වශයෙන් හඳුනා ගැනේ. තරුණ භික්ෂූන් තුළ පවතින තවත් පොදු දුර්වලතාවක් නම් සිය ආචාර්යවරයා කෙරෙහි හේතු රහිතව කලකිරෙන ස්වභාවයයි. භාගිනෙය්‍ය සංඝරක්ඛිත කතාවෙන් ප්‍රකට වන්නේ ඒ කාරණයයි. සිය ආචාර්යවරයා වෙත පිරිනැමූ සළුව උන්වහන්සේ නොපිළිගැනීම තමන් වෙත දැක්වූ අප්‍රසාදයක් වශයෙන් සිතන මේ තරුණ භික්ෂුව කිසිදු වගවිභාගයකින් තොරව ගුරුවරයාගෙන් වෙන්වී සිවුරු හැර යාමට සිතයි. වර්තමාන තරුණ

භික්ෂූන් වහන්සේලා මෙවැනි තීරණ ගන්නා අවස්ථා බොහොමයක් පිළිබඳ නිදර්ශන සැපයිය හැකිය.

**සමාලෝචනය**

බ්‍රහ්මචාරී හා පරාර්ථකාමී ජීවන රටාව මත භික්ෂු ජීවිතය ආත්මාර්ථ හා පරාර්ථ සාධනය සඳහා මෙහෙයවාගත යුතු බව මෙහි දී අවධාරණය කෙරේ. ඒ සඳහා බලපාන විවිධ බාධක විශ්ලේෂණය කර ඒවා පිළිබඳ අවබෝධයක් ලබාගැනීම තුළින් යෞවන භික්ෂු ආකල්ප සකස් කර ගැනීමට හැකියාවක් තිබෙන බව මෙම අධ්‍යයනයෙන් පෙන්වා දෙනු ලැබේ.

**ප්‍රමුඛ පද :** යොවුන් භික්ෂු ආකල්ප, බ්‍රහ්මචරියාව, පරාර්ථචරියාව, ධර්ම විනය

**ආශ්‍රිත ග්‍රන්ථ**

*චුල්ල වග්ගපාළි.* (1957). බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණය.

*ධම්මපද විවරණය.* (2004 ). (සංස්.) ඤාණෝභාසතිස්ස හිමි, මොරගොල්ලේ. කොළඹ: ගුණසේන.

*ධම්මපද පාළිය.* (1989 ). (සංස්.) ධම්මානන්ද නාහිමි, මොරන්තුඩුවේ. සුමනතිස්ස හිමි ප්‍රකිශිතයි.

*ධම්මපද පාළිය.* (1957). බුද්ධ ජයන්ති ත්‍රිපිටක මුද්‍රණය, කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණය.

*විනය පිටකයෙන් හෙළිවන ගුරුවරයා.* (2005). දේශිය දැනුම් ව්‍යාපෘතිය. මහරගම.